පස්සර ප්‍රාදේශීය සභාව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

පස්සර ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සමග 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට පස්සර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වයහාපොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදීවෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී .වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.4,839,338 ක කර්මාන්ත ණය හිමි වටිනාකමගිණුම්ගත කර නොතිබුණි.	ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ගිණුම් නිවැරදි කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේදී සතිපොළ ගොඩනැගිල්ල සඳහා නව විදුලි සම්බන්ධතාවයක් ලබාගැනීමට දරා තිබුණු රු.46,666 ක වියදම ප්‍රාග්ධනිත කර නොතිබුණි.	-එම-	-එම-
(ඇ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවක ණය ශේෂය රු.11,800 ක් අඩුවෙන් දක්වා තිබුණි.	-එම-	-එම-

1.6.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පොදු තැන්පතු ශේෂය තුළ ඇතුළත් රු.1,554,820 ක වටිනාකමක් තැන්පතු ලේඛන ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.	ඉදිරි වර්ෂයේ ගිණුම සමඟ උපලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	තැන්පත් ලේඛනය යාවත්කාලීන කළ යුතුය.

1.7 අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි			
(i)	මුදල් රෙගුලාසි 134(3)	වසර 05 කට අධික කාලයක සිට අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	ඉදිරියේදී අභ්‍යන්තර විගණන කටයුතු කිරීමට සැලසුම් කර ඇති බව.	අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.
(ii)	මුදල් රෙගුලාසි 775	හිටපු සභාපති/උප සභාපති විසින් පාවිච්චි කරන ලද ඉන්වෙන්ට්‍රිගත ජංගම දුරකථන 02ක් සහ ස්ථාවර දුරකතනයක් සභාවට භාරදී නොතිබුණි.	ඉන්වෙන්ට්‍රිගත කාර්යාල උපකරණ සභාවට භාර දෙන ලෙස දුරකථනයෙන් හා ලිපි මඟින් දන්වා යැවීමට කටයුතු කර ඇති බව.	මෙම වත්කම් සම්බන්ධව මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.31,369,364 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.21,709,927 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාවේ ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2024				2023			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තු ගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තු ගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
(i)	වරිපනම් බදු	12,734,457	12,890,586	9,632,093	5,843,000	7,256,159	6,738,358	4,886,434	4,521,000
(ii)	කුලී	20,476,722	25,736,508	22,035,908	24,679,768	21,477,122	20,461,415	15,949,298	20,709,616
(iii)	බලපත්‍ර ගාස්තු	393,100	561,353	561,353	-	1,076,600	356,618	356,618	-
(iv)	වෙනත් ආදායම්	16,060,500	24,088,249	6,529,625	23,110,731	17,171,500	24,872,931	11,158,849	21,405,622
	එකතුව	**49,664,779**	**63,276,696**	**38,758,979**	**53,633,499**	**46,981,381**	**52,429,322**	**32,351,199**	**46,636,238**

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) හිඟ හිටි ජල ගාස්තු		
වසර 05කට අධික කාලයක සිට පැවත එන හිඟ හිටි ජල ගාස්තු රු.308,586 ක් සමාලෝචිත වර්ෂයේදීද අයකරගෙන හෝ සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	දීර්ඝ කාලයක සිට පැවත එන හිඟ හිටි ජල ගාස්තු ලියාහැරීම සම්බන්ධව අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු සිදු කරමින් පවතින බව.	හිඟහිටි ජල ගාස්තුසම්බන්ධව කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ) හිඟ හිටි කඩ කුලී		
(i) වසර 05කට අධික කාලයක සිට පැවත එන හිඟ හිටි කඩ කුලී රු.20,570,716 ක් සමාලෝචිත වර්ෂයේදී ද අයකරගෙන නොතිබුණි.	පොත්වලින් ලියා හැරිය යුතු කඩකුලී සඳහා විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම සහ හිඟ කඩ කුලී අයකර ගැනීමට ගිවිසුම් අනුව කටයුතු කරන බව.	හිඟ කඩ කුලී අය කර ගත යුතුය.

(ii)	දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ප්‍රතිපාදන සහ පොදු වෙළදපොළ කඩහිමියන්ගෙන් රැස් කරගෙන තිබුණු රු.44,770,559 ක මුදල් යොදවා 2017 වර්ෂයේඉදිකළ පොදු වෙළදපොළ සංකීර්ණයේ කඩ කාමර 42 කින් 2024 දෙසැම්බර් 31 දිනට රු.16,559,330 ක කඩ කාමර කුලී හිඟ හිටව පැවතුණි.එසේ කඩ කාමර සෑදීම සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබාගෙන තිබුණු ණය මුදලට අදාළ මාසික ණය වාරිකය හා පොලිය රු.507,445 ක් වුවද, එම මුදල ගෙවීමට හෝ පොදු වෙළදපොළ සංකීර්ණයේ කඩ කාමර වලින් ප්‍රමාණවත් ආදායමක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.	කඩ කුලී මුල් තක්සේරුවෙන් සියයට 50 ක් අඩුකර අයකර ගැනීමටත්, දීර්ඝ කාලයක සිට පැවත එන හිඟ කඩ කුලිය අයකර ගැනීම පැහැර හරින කඩ හිමියන් පිළිබඳව නීති ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව.	ගිවිසුම් අනුව හිඟ හිටි කඩ කුලී අයකරගෙන දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබාගෙන තිබුණු ණය හා පොලී මුදල ගෙවිය යුතුය.
(iii)	2019 වර්ෂයේදී ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය අනුව පොදු වෙළදපොල සංකීර්ණයේ පැරණි කඩ කාමර හිමියන්17 ක් සඳහා නව කඩ කාමර බදු කුලියකට දෙපාර්ශවය අතර ගිවිසගෙන තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විටද කඩ හිමියන් විසින් ගිවිසුමේ ඇතුළත් රු.4,765,000 ක ආපසු නොගෙවන කඩ කුලී නොගෙවා ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යමින් පැවතුනි.	පොත්වලින් ලියා හැරිය යුතු කඩකුලී සඳහා විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම සහ හිඟ කඩ කුලී අයකර ගැනීමට ගිවිසුම් අනුව කටයුතු කරන බව.	ගිවිසුම් අනුව අයකරගත යුතු මුදල අයකරගත යුතුය.
(ඇ)	ඉකුත් වර්ෂය සහ සමාලෝචිත වර්ෂය සඳහා සන්නිවේදන කුළුණු 04 ක හිඟ ආදායම රු.26,400 ක් අයකරගෙන නොතිබුණු අතර, සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති සන්නිවේදන කුළුණු පිහිටා ඇති ස්ථාන සමීක්ෂණය කර හඳුනාගෙන නොතිබුණි.	සක්‍රීය තත්වයේ පවතින සන්නිවේදන කුළුණු හඳුනා ගැනීමට කටයුතු කරන බව.	සමීක්ෂණයක් සිදුකර ආදායම් සහ හිඟ ආදායම් අයකරගත යුතුය.

2.2.3 උසාවි දඩ හා මුද්දර

විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.12,685,991 ක් හා මුද්දර ගාස්තු රු.10,424,740 ක් ගෙන්වාගෙන නොතිබුණි.	ලැබිය යුතු මුද්දර ගාස්තු සහ උසාවි දඩ මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කර ඇති බව.	හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු ගෙන්වාගත යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 85(ආ) වගන්තිය අනුව මහජනයා ගැවසෙන සියළු ස්ථානවල වැසිකිළි පහසුකම් සැපයීම සභාව විසින් සිදුකළ යුතු වුවද,සභාවේ පොළ භූමිය තුළ පිහිටි කාන්තා සහ පිරිමි වැසිකිළි දෙකම නිසි නඩත්තුවක් නොකිරීම හේතුවෙන් අපිරිසිදුව පැවති අතර, සනීපාරක්ෂක වැසිකිළි පද්ධතියක් ඉදිකර නොතිබුණි.	පොදු වැසිකිළි පද්ධතියක් ඉදිකිරීමට සැලසුම් සකස් කරමින් පවතින අතර, තාවකාලික වැසිකිළි හා කැසිකිළි පද්ධතියක් සකස් කර ඇති බව.	1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 85(ආ) වගන්තිය අනුව මහජන උපයෝගිතා සේවා පවත්වා ගෙන යා යුතුය.
(ආ)	පුරනැගුම ව්‍යාපෘති අරමුදල් යටතේ වැඩ නිමකර සමාලෝචිත වර්ෂයේදී සභාවට භාරදී තිබුණු ජල පිරිපහදු ව්‍යාපෘති ගොඩනැගිල්ලේ පවතින අඩුපාඩු, පිරිපහදුවෙන් අනතුරුව ජලය බැහැර කිරීමට කාණු පද්ධතියක් නොමැතිවීම,ජල පොම්පාගාරය අක්‍රීයවීම,ජලය පිරිපහදු කිරීම සඳහා යොදන රසායනික ද්‍රව්‍ය යෙදීමේ ප්‍රමාණයන් පිළිබඳ පුහුණුවක් නොතිබීම, මිල්ලබැද්ද හා පුහුල්බැද්ද ජලාශවලින් රැගෙන එන නළ ජල සැපයුම ගබඩා කිරීමට ජල ටැංකි ධාරිතා ප්‍රමාණවත් නොවීම සහ පිරිපහදු මධ්‍යස්ථානයේ එලා තිබුණු නළ පද්ධතිය එක් එක් ස්ථානවලින් කැඩී යාම වැනි අඩුපාඩු පැවති අතර, මේ හේතුන් නිසා ප්‍රදේශවාසීන්ට ව්‍යාපෘතියෙන් නිසි ප්‍රයෝජනයක් ලැබී නොතිබුණි.	ජල පිරිපහදු මධ්‍යස්ථානය නඩත්තු කිරීම සහ කාර්ය මණ්ඩලයට පුහුණුවීම් හා උපදේශන සේවා ලබා ගැනීමට සැලසුම් සකස් කර ඇති බව.	මහජනතාවට පිරිසිදු පානීය ජලය ලබාදීමට කටයුතු කළ යුතුය.
(ඇ)	කොම්පෝස්ට් අංගනයට පිවිසෙන මාර්ගය කිලෝමීටරයක පමණ කොටසක් මේ දක්වා සංවර්ධනය කර නොතිබීමත්, කොම්පෝස්ට් අංගනයේ ස්ථිර ජල සැපයුමක් නොමැතිවීමක් හේතුවෙන් යන්ත්‍ර හා වාහන සේදීම සහ නොදිරන කසළ සේදීමට බවුසර් මගින් රැගෙන එන ජලය භාවිතා කිරීමට සිදුවී තිබීම දුෂ්කර කාර්යයක් වී තිබුණි. එමෙන්ම වසර 10ට අධික කාලයක සිට රැස් කරගෙන තිබුණු නොදිරන කසළ, අංගනයේ වළවල් කපා බැහැර කිරීම සහ තැනින් තැන ගොඩ ගසා තිබුණි.	භූමියේ උන්නතාංශය අනුව මාර්ගය සංවර්ධනය කිරීමට විශාල මුදලක් වැයවන බැවින් එවැනි වියදමක් දැරීම දුෂ්කර බැවින් වෙනත් ව්‍යාපෘතිවලින් අරමුදල් සපයාගෙන ප්‍රවේශ මාර්ගය සකස් කිරීමට සැලසුම් කර ඇති බව.	විධිමත්ව කසළ බැහැර කිරීම සිදු කළ යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1965 වර්ෂයේ සිට ප්‍රාදේශීය සභාවේ සතිපොළ පවත්වාගෙන ගිය තිබුණු ඉඩමේ 1971 සැප්තැම්බර් 07 දින සිදුකරන ලද මැනුම් සැලසුම් අංක 29232 අනුව අක්කර 01 රූඩ් 02 පර්චස් 7.3 ක භූමි ප්‍රමාණයක් තිබුණද, 2022 ජනවාරි 24 දින සිදුකරන ලද මැනුම් අනුව එම භූමියේ ප්‍රමාණය රූඩ් 03 පර්චස් 23 ක් පමණක්ව පැවතුණි. පැරණි ලේඛන වලට අනුව සභාව විසින් භුක්ති විඳි ඉඩම් ප්‍රමාණයෙන් රූඩ් 02යි පර්චස් 24.3 ක ප්‍රමාණයක් බාහිර පාර්ශවයන් විසින් අනවසරයෙන් පදිංචි වී තිබුණි. වසර 50 ක කාලයක් ගත වුවද, සභාව සතු ඉඩම් මැනුම් කර අයතිය තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙතින් මෙම ඉඩම් මැනුම් කටයුතු කර ප්‍රාදේශීය සභාවට පවරා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති බව සහ ඉඩම් පවරා ගැනීමේදී ප්‍රාදේශීය සභා පාලන විෂයෙන් පරිබාහිර වූ හේතු කාරණා නිසා මෙසේ ඉඩම් පවරා ගැනීම දීර්ඝ කාලීනව ප්‍රමාද වීමට හේතු වී ඇති බව.	සභාව භුක්ති විඳින ඉඩම්වල අයිතිය නිරවුල් කරගත යුතුය.
(ආ)	1980 ජූනි 16 දින පස්සර ගම් සභාවට මාඋස්සාගොල්ල අම්බලම හන්දියේ පොදු වැසිකිළි 02 ක් ඉදිකිරීම සඳහා ගෝනකැලේ වත්තෙන් රූඩ් 02 ක ඉඩම් කොටසක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ලිඛිතව භාරදී තිබුණි. සමාලෝචිත වර්ෂය වනවිට ඉදිකර තිබුණු වැසිකිළි වලට ප්‍රවේශ වීමට ප්‍රමාණවත් මාර්ග පහසුකම් නොතබා උක්ත ඉඩම් කොටසෙහි අනවසරයෙන් විවිධ පාර්ශවකරුවන් ස්ථිර ගොඩනැඟිලි ඉදිකර තිබුණි.	මෙම ඉඩම සභාවට පවරා දෙන ලෙස ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ඉල්ලීම් කර ඇති නමුත්, ඒ සඳහා යහපත් ප්‍රතිචාරයක් දක්වා නොමැති බව.	-එම-

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ඉකුත් වර්ෂයේ ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියේ (LDSP) මුල්‍යා ප්‍රතිපාදන රු.26,079,033 ක් වැය කර 2023 වර්ෂයේ වැඩ නිම කර සභාවට භාර දී තිබුණු නව වෙළඳ සංකීර්ණ ගොඩනැඟිල්ල නායයාමේ අවදානමට පත් වී තිබුණි. මේ හේතුවෙන් ගොඩනැඟිල්ල පිහිටි ස්ථානයේ භූමිය විශාල පිපිරීම්, ඇතුළත බිත්ති හා ටයිල් පුපුරායාම සහ වීදුරු දොරක් සම්පූර්ණයෙන්ම බිඳී තිබුණි. ගොඩනැඟිල්ල ඉදිකිරීමට පෙර 2022 අප්‍රේල් 28 දින ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානයේ භූමි යෝග්‍යතා සහතිකය ලබාගෙන තිබුණද, සහතිකයේ සඳහන් විශේෂ කොන්දේසි අංක 04 අනුව ගොඩනැඟිලි ඉදිකිරීම් කරන්නේ නම්, ඊට අදාළ සැලසුම් ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයට (NBRO) ඉදිරිපත් කර සැලසුම්වලට අදාළ නිර්දේශ ලබාගන්නා ලෙස අදාළ ලිපියෙන් දන්වා තිබුණද, නිර්දේශය සම්බන්ධව කළමනාකාරිත්වයේ අවධානය යොමු නොවීම හේතුවෙන් මෙවැනි අවදානමකට මුහුණ පෑමට සිදුවී තිබුණි.	පළාත් පාලන දෙපාර්තමේන්තුවේ LDSP ව්‍යාපෘති කාර්ය මණ්ඩලය විසින් සියළු අධීක්ෂණ කටයුතු සිදු කර ඇති අතර, නායයාමෙන් සිදුවූ හානිය සම්බන්ධව ඉන්ජිනේරුමය කාර්යයන් පිළබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) ආයතනයෙන් පරීක්ෂණ වාර්තාවක් ලබා ගෙන ඉදිරි කටයුතු කිරීමට සැලසුම් කර ඇති බව.	ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයේ භූමි යෝග්‍යතා සහතිකය මෙන්ම ඊට අදාළ සැලසුම් එකී ආයතනයට ඉදිරිපත් කර නිර්දේශ හා උපදෙස් ලබාගෙන ඉදිකිරීම් කළ යුතුය.
(ආ)	2016 ජනවාරි 01 සිට 2023 ජනවාරි 31 දින දක්වා දෛනික සේවයේ යෙදුනු සේවකයින් 36 ක් වෙනුවෙන් ගෙවිය යුතු සේවා නියුක්ත භාර අරමුදල් දායක මුදල රු.768,976 ක් ගෙවා නොතිබුණි. මෙම දායක මුදල ගෙවීමේ ප්‍රමාද වූ කාලයට රු.374,909 ක අධිභාර මුදලක් ගෙවීමට සභාවට සිදුව තිබුණි. අධිභාර මුදල ගෙවීම සම්බන්ධව වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	සභාවේ ප්‍රමාණවත් ස්වයං උත්පාදන ආදායමක් නොතිබූ නිසා සේවකයින්ගෙන් අය කර යවා නොතිබූ නිසා දායක මුදල් ගෙවා නොමැති බව සහ සම්පූර්ණ මුදලම 2024 මාර්තු 25 දින වන විට ගෙවීමට කටයුතු කර ඇති බව.	නියමිත කාලයට සේවක අර්ධසාධක අරමුදල් ගෙවීමට කටයුතු කළ යුතු අතර, අධිභාර ගෙවීමට අදාළ වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගත යුතුය.

04. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

අයවැය පාලනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රාදේශීය සභාව පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තු කල ආදායම් හා වියදම්, වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදි ආදායම් විෂයයන් 04 ක සියයට 22 සිට සියයට 104 දක්වාද වියදම් විෂයයන් 03 ක සියයට29 සිට සියයට59 දක්වාද විචලනයක් පැවතුණි. මේ අනුව අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.	2024 වර්ෂයේ අවසානයේදී විදුලිය,වාහන රක්ෂණ සහ වාහන අලුත් වැඩියාවන් කළමනාකරණය කිරීම හේතුවෙන් ප්‍රතිපාදන ප්‍රමාණයක් ඉතිරි වූ බව.	ආදායම් වියදම් සම්බන්ධ විචලතාවය අවම කරගත යුතුය.